# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින්
2017 අගෝස්තු මස 23 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 අගෝස්තු මස 03 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[201 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 005410—510 (2017/08)

# විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

එල්.ඩී.—ඕ. 41/2017.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 154ඈඇ අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

2. (මෙහි මින්මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඇ ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඈඇ ව්‍යවස්ථාව ලෙස බලපැවැත්විය යුතු ය:—

''පළාත් සභා ඡන්ද විමසීම.

154ඈඇ. සියලුම පළාත් සභාවලට මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පවත්වනු ලැබිය යුතු අතර, (මේ පරිච්ඡේදයේ ''නිශ්චිත දිනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) සියලුම පළාත් සභා විසිරෙන දිනය පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, ඒ නිශ්චිත දිනය, අවසානයට සංස්ථාපනය කරන ලද පළාත් සභාවේ ධුර කාලය ඉකුත් වන දිනයට පසු දිනයක් නො විය යුත්තේ ය.''.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඉ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඉ ව්‍යවස්ථාවේ ''විසිර ගියාක් සේ සැලකෙන්නේ ය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

2—PL 005348—475 (2017/08)

''විසිර ගියාක් සේ සැලකෙන්නේ ය:

එසේ වුව ද, 154ඇඇ ව්‍යවස්ථාව යටතේ වූ නිශ්චිත දිනය නිශ්චය කරනු ලැබීමෙන් පසුව-

(අ) නිශ්චිත දිනයට පෙරාතුව අවසන් වන යම් පළාත් සභාවක ධුර කාලය නිශ්චිත දිනය දක්වා දීර්ඝ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පළාත් සභාව නිශ්චිත දිනයේ දී විසිරෙන්නේ ය; හෝ

(ආ) නිශ්චිත දිනය ඉක්මවමින් ක්‍රියාත්මක වන යම් පළාත් සභාවක ධුර කාලය නිශ්චිත දිනයේ දී අවසන් විය යුතු අතර, ඒ පළාත් සභාව නිශ්චිත දිනයේ දී විසිරෙන්නේ ය.''.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 154ඉඉ අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඉ ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඉඉ ව්‍යවස්ථාව ලෙස බලපැවැත්විය යුතු ය:—

''පාර්ලිමේන්තුව විසින් පළාත් සභාවක බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බව.

154ඉඉ. 154ආ ව්‍යවස්ථාවේ (8) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා හෝ යම් නීතියක නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් හේතුවක් නිසා යම් පළාත් සභාවක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක දී, ඒ පළාත් සභාවේ බලතල, නිශ්චිත දිනය තෙක් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, 154ඔ සහ 154ඕ ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව පළාත් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.